❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

❖ ඡේදය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පහුර ගඟ පහළට ඇදී ගියේ ය. ගඟ දෙපස ඇති උණ පඳුරුවල අගිස් ගඟට නැමී ඇත්තේ කර උස්සා අප දෙස බලා සිටින මිනිසුන් මෙනි. ඒ උණ පඳුරුවල වැසූ කොකුන්ගේ සුදු පෙනෙන්නේ ඉගිලෙන විට ය. විශාල කොට්ටං ගස්වල එල්ලුණු වවුලන් නගන හඬ චිරි චිරිස් හඬින් ඇසේ. උන් පියඹා යන්නේ හෙලිකොප්ටර් යානා පරිද්දෙනි.

(ගඟ අද්දර කැලේ - සෝමවීර සේනානායක)

(01) ගඟ දෙපස ඇත්තේ මොනවා ද? ..........................................................................................

(02) උණ පඳුරුවල වසා සිටින්නේ කවුද? ..........................................................................................

(03) ගඟ පහළට ඇදී ගියේ කුමක් ද? ..........................................................................................

(04) මෙම ඡේදය උපුටා ගත් පොතේ නම කුමක් ද? ..........................................................................

(05) හෙලිකොප්ටර් යානා මෙන් පියඹා යන්නේ කවුද? ..................................................................

(06) ඡේදයේ සඳහන් තාලුජ 'ශ' අකුරක් යෙදුණු වචනයක් ලියන්න. ..............................................

(07) පහත සඳහන් පදවලට විරුද්ධාර්ථවත් පද ඡේදයෙන් සොයා ලියන්න.

1. ඉහළට - .................................        2. කුඩා - ....................................

(08) ඡේදය කියවා පහත සඳහන් ප්‍රකාශ හරි නම් '✓' ලකුණ ද, වැරදි නම් '✗' ලකුණ ද වරහන් තුළ යොදන්න.

1. පහුර ඉහළට ඇදී ගියේ ය. (    )
2. උණ පඳුරුවල අගිස් ගඟට නැමී ඇත. (    )
3. කොක්කු හෙලිකොප්ටර් මෙන් පියඹා යති. (    )
4. උණ ගස්වලින් චිරි චිරිස් හඬක් ඇසෙයි. (    )

(09) හිස්තැනට සුදුසු වචන වරහන් තුළින් තෝරා වැකි සම්පූර්ණ කරන්න.

( ඈ , ඔහු , ඌ , ඔවුහු )

1. බින්දු සති අන්තයේ නිවාඩුවට ගමේ ගියේ ය. ..................... සීයාගෙන් රස කතා අසා ගත්තේ ය.
2. මිනෝෂි කුඩා ගැහැනු ළමයෙකි. .................. මිහිරි ගීතයක් ගායනා කළා ය.
3. කුසල් හා ජනිත් එකම පවුලේ සහෝදරයෝ වෙති. ..................... තම දෙමාපියන් එනතුරු මග බලා සිටිති.
4. ලේන් පැටියා බිමට වැටුණේ ය. ................ ඉක්මනින් අසල ගසට නැග ගත්තේ ය.

(10) වචන ගළපා නිවැරදි ව වැකි ලියන්න.

1. සිත් / ගත්තා ය / ඇය / කාගේත්

..............................................................................................................

2. සොයා / ඉගිළෙති / කෑම / කුරුල්ලෝ

..............................................................................................................

3. නවකතා / පොතක් / ලියයි / ලේඛකයා

..............................................................................................................

4. පරිසරයට / ආදරය / කරමු / අපි

..............................................................................................................

(11) පහත දැක්වෙන අක්ෂර ගැළපෙන සේ රවුම් තුළ ඇති හිස්තැන් මත ලියන්න.

( ර , ල , අඃ , ම , උ , ඉ , අං , බ , ද , ඍ , ඵ , න )

| ආරෝහණ අක්ෂර | අවරෝහණ අක්ෂර | මධ්‍ය අක්ෂර |
|---|---|---|
| 1. ........... | 1. ........... | 1. ........... |
| 2. ........... | 2. ........... | 2. ........... |
| 3. ........... | 3. ........... | 3. ........... |
| 4. ........... | 4. ........... | 4. ........... |

(12) පහත දී ඇති වාක්‍ය නිවැරදි ලෙස අතීත කාලයට හරවා දී ඇති හිස්තැන මත නැවත ලියන්න.

1. අපි නිවසේ සිට පාඩම් කරමු.

..............................................................................................................

2. මම කරුණු සෙවීමට පොතක් කියවමි.

..............................................................................................................

3. ඇය හරවත් කතාවක් කරයි.

..............................................................................................................

4. ඔහු හොඳින් සවන්දෙයි.

..............................................................................................................

5. ගොවියෝ නිවෙස් කරා යයි.

..............................................................................................................

(13) අඩු අකුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

| | | | |
|---|---|---|---|
| 1. පෝෂ......ය | ( ණ / න ) | 2. කො......ඹ | ( ල / ළ ) |
| 3. ප්‍රකා......නය | ( ෂ / ශ ) | 4. ගවේ......ණය | ( ෂ / ශ ) |
| 5. පො......ව | ( ළො / ලො ) | 6. ......පටි | ( ල / ළ ) |

(14) නිවැරදි ව උක්තය හා ආඛ්‍යාතය ගළපා 'මම ගසක් වෙමි' යන මාතෘකාව යටතේ වැකි පහක් ලියන්න.

1. ..............................................................................................
2. ..............................................................................................
3. ..............................................................................................
4. ..............................................................................................
5. ..............................................................................................

(15) පහත පින්තූරය දෙස බලා දෙබසක් ලියන්න.



කොකා :- ඉබී යාළුවේ.... ඉබී යාළුවේ....

ඉබ්බා :- ආ...... කොක් යාළුවේ. සුබ උදෑසනක් වේවා !

..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................
..............................................................................................

(16) පහත දක්වා ඇති චිත්‍රය දෙස හොඳින් බලා උක්තය ආඛ්‍යාතය නිවැරදි වැකි පහක් ලියන්න.



1. ..............................................................................................
2. ..............................................................................................
3. ..............................................................................................
4. ..............................................................................................
5. ..............................................................................................